# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2321/68 - 2023 මාර්තු මස 02 වැනි බ්‍රහස්පතින්දා - 2023.03.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

3 වැනි වගන්තිය යටතේ නියමය

සංශෝධිත පරිදි වූ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, මෙහි උපලේඛනයේ I තීරුවෙහි නිශ්චිතව දක්වා ඇත්තාවූ ද, එම උප ලේඛනයෙහි II තීරුවෙහි අනුරූප සටහනෙහි සඳහන් මායිම් හා ඉම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තා වූද, ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින්, ඒ ප්‍රදේශය ඒ වගන්තියේ කාර්ය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතුයැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

**ප්‍රසන්න රණතුංග** (පා.ම),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2023 පෙබරවාරි මස 20 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 හා 18 මහල,
''සුහුරුපාය'' සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

1A - G 39005 — 21 (2023/03)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## උපලේඛනය I

### මොණරාගල නාගරික සංවර්ධන බල ප්‍රදේශය පුළුල් කිරීම

*I වැනි තීරුව*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1979.06.01 දිනැති සහ අංක 38/16 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* අනුව නාගරික සංවර්ධන අධිකාරි බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද මොණරාගල දිස්ත්‍රික්කයේ මොණරාගල නාගරික සංවර්ධන බල ප්‍රදේශයට කොටස් වශයෙන් අයත් වන්නා වූ අංක 130B වැලියාය ග්‍රාම නිලධාරි වසම ද, 129E මාගන්දනමුල්ල ග්‍රාම නිලධාරි වසම ද, අංක 129B මොණරාගල ග්‍රාම නිලධාරි වසම ද, අංක 129F විහාරමුල්ල ග්‍රාම නිලධාරි වසම ද, අංක 129C හුලංදාව ග්‍රාම නිලධාරි වසම ද, අංක 129D හිදිකිවුල ග්‍රාම නිලධාරි වසම ද, අංක 129 මුප්පනේ ග්‍රාම නිලධාරි වසම හා අංක 129G හුලංදාව වම ග්‍රාම නිලධාරි වසම්වලට අමතරව අංක 130B වැලියාය ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටස ද, අංක 129E මාගන්දනමුල්ල ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටස ද, අංක 129B මොණරාගල ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටස ද, අංක 129F විහාරමුල්ල ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටස ද, අංක 129C හුලංදාව ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටස ද, අංක 129 මුප්පනේ ග්‍රාම නිලධාරි වසමේ ඉතිරි කොටස ද, අංක 129D හිදිකිවුල ග්‍රාම නිලධාරි වසමේ කොටසක් ද, අංක 129G හුලංදාව වම ග්‍රාම නිලධාරි වසමේ කොටසක් ද, අංක 130D රත්තනපිටිය ග්‍රාම නිලධාරි වසමේ කොටසක් ද, අංක 127 කොළොන්වින්න ග්‍රාම නිලධාරි වසමේ කොටසක් ද, අංක 129A කවුඩාව ග්‍රාම නිලධාරි වසමේ කොටසක් සහ අංක 1291 අලියාවත්ත ග්‍රාම නිලධාරි වසම ද, ඇතුළත්වන්නා වූ මුළු මහත් ප්‍රදේශය ඇතුළත් වේ.

*II වැනි තීරුව*

**උතුරට :**

දෙහිවැල්ලන්ද මාර්ගයේ මධ්‍ය රේඛාව හා රත්තනපිටිය මාර්ගයේ මධ්‍ය රේඛාව ඡේදනය වන ලක්ෂ්‍යයෙන් ආරම්භ වී රත්තපිටිය මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ නැගෙනහිර හා ඊසාන දිශානුගතව ඇඳි රේඛාව සිරිමයුර මාවතේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට සිරිමයුර මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු, ඊසාන දිශානුගතව ඇඳි රේඛාව අංක 130B වැලියාය ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද එතැන් සිට 130B වැලියාය ග්‍රාම නිලධාරි වසමේ බටහිර මායිම ඔස්සේ නිරිතට, උතුරට, ඊසානට, බටහිරට, ඊසානට, නැගෙනහිරට හා උතුරු දිශානුගතව ඇඳි රේඛාව අංක 130B වැලියාය ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම දක්වා ද, එතැන් සිට අංක 130B වැලියාය ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම ඔස්සේ නැගෙනහිරට, ගිණිකොණට, නැගෙනහිරට, දකුණට, නැගෙනහිරට, ඊසාන දිශානුගතව ඇඳි රේඛාව අංක 1291 අලියාවත්ත ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම ඔස්සේ ගිණිකොණට, උතුරට, නැගෙනහිර හා දකුණ දිශානුගතව ඇඳි රේඛාව අංක 127 කොළොන්වින්න ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට අංක 127 කොළොන්වින්න ග්‍රාම නිලධාරි වසමේ උතුරු මායිම ඔස්සේ දකුණට, නැගෙනහිරට, ඊසාන හා ගිණිකොණ දිශානුගතව ඇඳි රේඛාව බෙරලියපොල - කොළොන්වින්න මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද,

**නැගෙනහිරට :**

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට බෙරලියපොල - කොළොන්වින්න මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ නිරිත දිශානුගතව ඇඳි රේඛාව වැදිකුඹුර මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද,

**දකුණට :**

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට වැදිකුඹුර මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ වයඹ හා නිරිත දිශානුගතව ඇඳි රේඛාව අංක 1291 අලියාවත්ත ග්‍රාම නිලධාරි වසමේ නැගෙනහිර මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට

උපලේඛනය I (*සම්බන්ධිතයි*)

**මොණරාගල නාගරික සංවර්ධන බල ප්‍රදේශය පුළුල් කිරීම**

අංක 1291 අලියාවත්ත ග්‍රාම නිලධාරී වසමේ නැගෙනහිර මායිම ඔස්සේ නිරිත දිශානුගතව ඇඳි රේඛාව අංක 1291 අලියාවත්ත ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිමත් උඩ ආරාව මාර්ගයේ මධ්‍ය ලක්ෂ්‍යයත් ඡේදනය වන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට උඩඅරාව මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ බටහිරට, ගිණිකොණට, නිරිතට හා ගිණිකොණ දිශානුගතව ඇඳි රේඛාව හුලංදාව වම මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට හුලංදාව වම මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ වයඹ දිශානුගතව ඇඳි රේඛාව මහවෙල ආරම්භ වන මංසන්ධියේ මධ්‍ය ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට මහවෙල කුඹුරු යායේ නැගෙනහිර හා උතුරු මායිම ඔස්සේ උතුරු හා බටහිර දිශානුගතව ඇඳි රේඛාව හුලංදාව ඔයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට හුලංදාව ඔයේ මධ්‍ය රේඛාව ඔස්සේ දකුණු දිශානුගතව ඇඳි රේඛාව අංක 129 මුප්පනේ ග්‍රාම නිලධාරි වසමේ දකුණු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට අංක 129 මුප්පනේ ග්‍රාම නිලධාරි වසමේ වයඹ දිශානුගතව බදුල්ල - පස්සර මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන ලක්ෂ්‍යය දක්වා ද,

බටහිරට :

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට බදුල්ල - පස්සර මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු දිශානුගතව ඇඳි රේඛාව රත්මල් මාවත ආරම්භ වන මංසන්ධියේ මධ්‍ය ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට රත්මල් මාවතේ මධ්‍ය රේඛාව ඔස්සේ උතුරු හා වයඹ දිශානුගතව ඇඳි රේඛාව සුමේධ වැව දකුණු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට සුමේධ වැව් බැම්ම ඔස්සේ උතුරු දිශානුගතව ඇඳි රේඛාව සුමේධ වැව උතුරු මායිම හමුවන ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට දෙහිවැල්ලන්ද මාර්ගයේ මධ්‍ය ලක්ෂ්‍යය ඔස්සේ උතුරු දිශානුගතව ඇඳි රේඛාව දෙහිවැල්ලන්ද මාර්ගයේ මධ්‍ය රේඛාව සහ රත්තනපිටිය මාර්ගයේ මධ්‍ය රේඛාව ඡේදනය වන මංසන්ධියේ පිහිටි ආරම්භක ලක්ෂ්‍යය දක්වා ද වේ.

EOG 03-0018

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.